# 2019 මැයි මස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2019 මැයි මස මාසික සභා රැස්වීම 2019.05.09 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු උප සභාපති - ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඒ.ගුණතිලක මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්.රත්නපාල මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඒ.ඩබ්ලිව්.සුමනාවතීමැතිතුමිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

## නිලධාරී සහභාගීත්වය

1. ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.රත්නාවතී මැණිකේ මෙනවිය
2. කළමනාකරණ සහකාර - එච්.ඒ.පී.එන්.හෙට්ටිආරච්චි මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපති තුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්යමණ්ඩලයත් පිළිගනිමින්,පාස්කු ඉරු දින සිදුවූ ත්‍රස්ත ප්‍රහාරයෙන් මියගිය අය සිහි කිරීම වෙනුවෙන් විනාඩියක නිෂ්ශබ්දතාවයකින් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

## 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම

2018.10.04 වන දින පැවති මාසික සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

## 2. ගරු සභාපතිතුමාගේ නිවේදන

I. පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් ඔහුගේ අංක ACLG6/8/3 හා 2019.05.06 දිනැති ලිපිය මඟින් සභාවේ හදිසි යෝජනා ලෙස ඉදිරිපත් කරන යෝජනා යටතට හදිසි නොවන යෝජනාද ඇතුලත්ව ඇති බවත්,ඉදිරියේදී එසේ නොකරන ලෙසත් දන්වා එවා ඇති බව සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

II. **ජල බිල්පතේ නම සංශෝධනය කිරීම**

- ඩබ්ලිව්.ඒ.ගයානි අනූෂා දමයන්ති යන නමින් PL 229 අංක දරණ ජල බිල් පත ඩී.විමලසේන නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

III. වරිපනම් බදු නැවත තක්සේරු කිරීම

IV. ඕපනායක ඉදිකිරීමට අපේක්ෂිත හෙල බොජුන් හල සම්බන්ධයෙන් 2019.04.11 වන දින සභාවේ යෝජනා කරගත් පරිදි සිදුකල සමීක්ෂණයේ වාර්තාවක් සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා වෙත ඉදිරිපත් කරන ලදී.

## 3. සභාව නමින් ලැබී ඇති ලිපි, පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම

### 3.1. ක්‍රීඩා කිරීමට අවශ්‍ය ක්‍රීඩා උපකරණ කිහිපයක් ලබා ගැනීම

ලේකම්, කෝන්ගස්තැන්න ක්‍රීඩා සමාජය විසින් ඉහත මැයෙන් යුතුව 2019.03.26 දිනැතිව එවන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

### 3.2. මාර්ගයක් කොන්ක්‍රීට් කර ගැනීම සම්බන්ධවයි

පොල්ලමුර උඩගංගොඩ ග්‍රාමසේවා වසමේ පිහිටි සූසාන භූමි මාවතේ අඩි 200ක පමණ කොටසක් කොන්ක්‍රීට් කිරීමට අවශ්‍ය බවට යූ.ඩබ්ලිව්.සෝමදාස ,ලේකම්, පොදු ජන එක්සත් පෙරමුණ,පොල්ලමුර විසින් 2019.03.22 දිනැතිව එවන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

## 4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය.

## 5. <u>කල් දී ඇති යෝජනා</u>

### 5.1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත සඳහන් යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.

I. හඳගිරිය ප්‍රජාශාලාව අසල මාර්ගය පිළිසකර කිරීම සඳහා ද්‍රව්‍ය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ සම්බන්ධව අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා,හඳගිරිගොඩ නිවාස 100 ගම්මානයට යන මාර්ගය මේවන විට ඉතා අබලන් තත්වයකට පත්වී ඇති බැවින් හඳගිරිය ප්‍රජාශාලාව අසල ඇති මෙම මාර්ගය පිළිසකර කර ගැනීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා දෙන මෙන් ඉල්ලා සිටින ලදී.අනතුරුව ගරු රත්නපාල මන්ත්‍රීතුමාගේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

### 5.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලකමැතිතුමා විසින් පහත සඳහන් යෝජනාව සභා ගත කරන ලදී.

I. බෝපිටිගොඩ ග්‍රාම නිලධාරී වසමේ අඹගහමුල්ල මාර්ගයේ අඹගහමුල්ල ආර හරහා පැති බැම් බැද කොන්ක්‍රීට් කිරීමට රු.50000/= ක මුදලක් ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

බෝපිටිගොඩ ග්රාම නිලධාරී වසමේ අඹගස්මුල්ල මාර්ගයේ අඹගස්මුල්ල ආර හරහා හියුම් පයිප්ප යොදා ඇති බැවින් දෙපස පැති බැම්ම බැඳ එම කොටස කොන්ක්‍රීට් කිරීම සඳහා අදාල මුදල අවශ්‍ය බව ගරු මන්ත්‍රීතුමා කරුණු දැක්වීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

### 5.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. බුද්ධික වීරසිංහ මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. තැන්නහේන ග්‍රාම නිගධාරි වසමේ පහළගම්මැද්ද බණ්ඩාරවත්ත පාර කොන්ක්‍රීට් කිරීම සුදුසු බවත්,

II. රංවල කොට්ඨාශයේ පහත සඳහන් ස්වේච්ඡා සමිති සඳහා ද්‍රව්‍යාධාර ලබා දීම අවශ්‍ය බවත්,යෝජනා කරන ලදී.

- වෙලගෙපොල එක්සත් සුභසාධක සංගමය - ගෑස් ලිප් 01
- මහඕමාර ගැමිදිරිය සුභසාධක සංගමය - ගෑස් ලිප් 01
- පහල මහඕමාර අවමංගල්‍යාධාර සමිතිය - ප්ලෑෂ් ලයිට් 02
- රංවල සහන අවමංගල්‍යාධාර සමිතිය - ප්ලෑෂ් ලයිට් 02
- උඩරංවල අවමංගල්‍යාධාර සමිතිය - ප්ලෑෂ් ලයිට් 02
- දෙල්වල කන්ද ඇල්ලමණ්ඩිය සුභසාධක සමිතිය - ප්ලෑෂ් ලයිට් 02
- තැන්නහේන ශක්ති සුභසාධක සමිතිය - ප්ලෑෂ් ලයිට් 02
- තැන්නහේන පිටවෙල එක්සත් අවමංගල්‍යාධාර සමිතිය - ප්ලෑෂ් ලයිට් 02
- එළමල්පේ අවමංගල්‍යාධාර සමිතිය - ප්ලෑෂ් ලයිට් 02
- හාන්දුගම දිදුල සුභසාදක සංගමය - පුටු 15

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

### 5.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. නරිස්ස බස්නකන්ද මාර්ගයේ බටදූර වසම කොටසේ මීටර් 300 පමණ කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්,
II. බටේවෙල මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්,
III. ඉඹුල්තැන්න සුසාන භූමියේ ශාලාවක් ඉදිකිරීම සුදුසු බවත්,
IV. බටේවෙල මාර්ගයේ අබලන් ස්ථාන බැකෝ යන්ත්‍රය යොදාගෙන සංවර්ධනය කිරීම සුදුසු බවත්,
V. බස්නකන්ද ගල්කන්ද මාර්ගය බැකෝ යන්ත්‍රය යොදාගෙන කාණු දමා සංවර්ධනය කිරීම අවශ්‍ය බවත්,
VI. බස්නකන්ද ප්‍රදේශයට සුසාන භූමිය සඳහා ඉඩමක් වෙන් කර ගැනීම අවශ්‍ය බවත්,
VII. හටංගල කහකැටිආර මාර්ගය කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්,
VIII. හටංගල දියවිනි කුඹුර මාර්ගය කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්,
IX. හංවාන මාර්ගය කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්, යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 6. කාරක සභා වාර්තා සලකා බැලීම.

කාරක සභා වාර්තා කිසිවක් නොවීය.

## 7. ආදායම් වියදම් වාර්තා

## 7.1. 2019 මාර්තු මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය | (රුපියල්) | වැය සාරාංශය | (රුපියල්) |
|---|---|---|---|
| වරිපනම් බදු | 641,509.19 | වැටුප් හා දීමනා | 2,629,983.08 |
| කුලී | 45,713.46 | ගමන් වියදම් | 62,948.00 |
| බලපත්‍ර ගාස්තු | 402,250.00 | සැපයුම් හා උපකරණ | 462,227.00 |
| සේවා සඳහා ගාස්තු | 120,676.02 | ප්‍රාග්ධන වත්කම්අළුත්වැඩියා හා නඩත්තුව | 72,373.56 |
| වරෙන්තු ගාස්තු | 5,161.69 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 405,794.27 |
| වෙනත් ආදායම් | 38,898.42 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | 380,091.76 |
| වෙනත් ආධාර | 2,168,844.98 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 3,423,053.76 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | 26,489.12 |
| මූලධන ලැබීම් | 15,680.00 | පුනරාවර්තන වියදම් එකතුව | 4,039,906.79 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | 15,680.00 | ප්‍රාග්ධන වැය | 252,338.79 |
| පුනරාවර්ථන ප්‍රාග්ධනආදායම් එකතුව | 3,438,733.76 | ණය ආපසු ගෙවීම් | - |
| සේවක ණය | 50,732.78 | සේවක ණය | 50,000.00 |
| තැන්පත් | 167,122.08 | තැන්පත් | 81,047.08 |
| අත්තිකාරම් | 0.00 | ණයහිමි | 18,000.00 |
| ණය ගැති(කර්මාන්ත) | - | අත්තිකාරම් | - |
| වෙනත් ලැබීම් එකතුව | 217,854.86 | ජල ගබඩා | 340,000.00 |
| | | ගබඩා(ඖෂධ) | 150,000.00 |
| | | සමුච්චිත අරමුදල | - |
| | | වෙනත් ගෙවීම් | |
| | | වෙනත් ගෙවීම් එකතුව | 299,047.08 |
| මුළු එකතුව | 3,656,588.62 | මුළු ගෙවීම් | 4,591,292.66 |

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2018.12.31 ට හිඟ | 2019 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2019.03.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | අයකිරිමට ඇති ඉතිරිය |
|---|---|---|---|---|---|---|

**7.2. <u>2019 මාර්තු 31 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා</u>**

| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | වරිපනම් බදු 1.11 | 5827830 | 1940000 | **248371** | **4%** | **535547** | **28%** | **1404453** | 5579459 |
| 2 | අක්කර බදු 1.12 | 74020 | 20900 | **4821** | **7%** | **1037** | **5%** | **19863** | 69198 |
| 3 | සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීම1.43 | | 200000 | | | **29050** | **15%** | **170950** | |
| 4 | ව්‍යාපාර බදු 2.16 | | 267600 | - | | **99000** | **37%** | **168600** | |
| 5 | වෙළෙඳ බලපත්‍ර ගාස්තු2.31 | | 808000 | - | | **386000** | **48%** | **422000** | - |
| 6 | පරිසර බලපත්‍ර ගාස්තු2.37 | | 30000 | | | **6000** | **20%** | **24000** | |
| 7 | ලියාපදිංචි සහතික හා පරීක්ෂණ ගාස්තු | | 467000 | | | **22894** | **5%** | **444106** | |
| 8 | ජල ගාස්තු 4.14 | 2140545 | 6705000 | 1045322 | **49%** | **452055** | **7%** | **6252945** | 1095223 |
| 9 | විකුණුම් | | 564500 | | | **93151** | | | |
| 10 | යන්ත්‍ර කුළියට දීම3.25(2)/3.25(3) | | 845500 | | | **0** | **0%** | **845500** | |
| 11 | වාහන නැවතුම්පල ගාස්තු 5.43 | | 300000 | | | | **0%** | **300000** | |
| 12 | ගොඩනැඟිලි බලපත්‍ර3.43(4) | | 300000 | | | **88983** | **30%** | **211017** | |
| 13 | පොදු වෙළඳපල කුළී | | | | | | | | |
| 14 | මස්කඩ මාළු කඩ කුළී 5.23(2) | 183158 | 463200 | 0 | **0%** | **0** | **0%** | **463200** | 183158 |
| 15 | ප්‍රමාද ගාස්තු | | 94000 | | | **4465** | **5%** | **89535** | |
| 16 | විනෝද බදු 6.15 | | 1000 | | | **-** | **0%** | **1000** | |
| 17 | සතිපොළ ගාස්තු5.23(1) | 0 | 254000 | 0 | | **33220** | **13%** | **220780** | - |
| 18 | බොජුන් හල සඳහා ගාස්තු5.23(3) | | | | | **0** | | | |
| 19 | දැන්වීම් පුවරු ගාස්තු1.37 | | 400000 | | | **205000** | **51%** | **195000** | |
| 20 | ජල බවුසරය කුළියට දීම 4.25 | | 300000 | | | **17000** | **6%** | **283000** | |
| 21 | ක්‍රීඩා පිටිය කුලියට දීම 6.25 | | 2000 | | | **0** | **0%** | **2,000** | |
| **22** | වෘත්තීය බලපත්‍ර 1.33 | | **100** | | | **-** | **0%** | **100** | |
| **23** | පොලී ආයෝජන 1.61 | | **500** | | | | **0%** | **500** | |
| **24** | සේවක ණය පොලී1.64 | | **40000** | | | **14087** | **35%** | **25913** | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| **25** | අයකර ගතහැකි ගාස්තු2.43 | | **25000** | | | **0** | **0%** | **25000** | |
| **26** | සභාව සතු ගොඩනැගිලි3.25.1 | | **1000** | | | **-** | **0%** | **1000** | |

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2018.12.31 ට හිඟ | 2019 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2019.03.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| **27** | දඩ අනවසර ඉදිකිරීම් 3.52 | | **500** | | | **-** | **-** | **500** | |
| **28** | අය කර ගත හැකි ගාස්තු 4.43 | | **1000000** | | | **213000** | **21%** | **787000** | |
| **29** | විශේෂ සැපයුම් සඳහා ගාස්තු4.16 | | **5000** | | | **-** | **-** | **5000** | |
| **30** | පොළ භූමිය කුලියට දීම්5.25 | | **1000** | | | **-** | **-** | **1000** | |
| **31** | ක්‍රීඩා පිටි ටකරන් මඩු කුලියට දීම්6.25 | | **2000** | | | **0** | **0%** | **2000** | |
| | **වෙනත් ආදායම්*** | **44488** | **878140** | **30234** | **68%** | **146113** | **17%** | **732027** | |
| | **මුළු එකතුව** | **8270041** | **15915940** | **1328748** | **16%** | **2346601** | **15%** | **13097990** | **6927038** |

වෙනත් ආදායම්*

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2018.12.31 ට හිඟ | 2019 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2019.03.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| **1** | ලියාපදිංචි කිරීමේ සහතික හා පරීක්ෂණ ගාස්තු | | | | | | | | |
| **2** | ඉඩම් හා ගොඩනැගිලි බදු දීම් | | | | | | | | |
| **3** | පා පැදි බලපත්‍ර 1.35 | | **150** | | | **4.00** | **3%** | **146** | |
| **4** | වරිපනම් සංශෝධන ගාස්තු | | | | | | | | |
| **5** | **වැසිකළි කුලියට දීම** | | | | | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 6 | කසල ඉවත් කිරීමේ ගාස්තු 2.13 | 20000 | 107000 | 20,000.00 | 1.00 | 1,000 | 1% | 106000 | - |
| 7 | සභා භූමිය කුලියට දීම | | | | | | | | |
| 8 | පාරවල් පළුදු වීම වෙනුවෙන් ගාස්තු | | | | | | | | |
| 9 | නොපවරවා ගැනීමේ සහතික ගාස්තු 3.43.(1) | | 200000 | | | 34500 | 17% | 165500 | |
| 10 | පුස්තකාල සේවා ගාස්තු 6.43 | | 15000 | | | 930 | 6% | 14070 | |
| 11 | පුස්තකාල දඩ 6.52 | | 20000 | | | 2025 | 10% | 17,975 | |
| 12 | ඉඩම් විකිණීම මත බදු | | | | | | | | |
| 13 | ඉඩම් බදු 3.24 | 24488 | 448390 | 10234 | 42% | 93654 | 21% | 354736 | 14,254.39 |
| 14 | වෙළෙඳ ස්ථාන කුලී03.22 | | 87600 | | | 14000 | 16% | 73,600.0 | |
| | එකතුව | 44488 | 878140 | 30234 | 68% | 146113 | 17% | 732027 | 14,254.39 |

## 8. <u>පසුගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම</u>

පසුගිය සභා රැස්වීමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමුකර ඇති බව,ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

## 9. වෙනත් කරුණු

### 9.1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා

හුණුවල වතු රෝහලේ පවතින වෛද්‍ය පුරප්පාඩු හේතුවෙන් රෝගීන් දැඩි අපහසුතාවට පත් වන බවත්,ඒ සම්බන්ධව ගිය සභා වාරයේදී තමන් අදහස් දැක්වූ බවත්,මේ වන තෙක් රෝහලේ කටයුතු සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කරුණු අනාවරණය කරන ලදී.

### 9.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා

පාස්කු ඉරු දින සිදු වූ ත්‍රස්ත ප්‍රහායට ගොදුරු වූවන්හට සිය ශෝකය ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමා ,පහත කරුණු අනාවරණය කරන ලදී.

පවතින අනාරක්ෂිත තත්වය හමුවේ දමාපියන් තම දරුවන් පාසල් යැවීමට බිය වන බවත්,පාසල් වල දරුනන් වෙනදා මෙන් නොසිටින

## සභා රැස්වීමේ නිමාව

ප්‍රාදේශීය සභාව මඟින් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් යම් සේවාවක් ඉටු කිරීමට සියළුදෙනා සහයෝගයෙන් එක්ව කටයුතු කලයුතු බව පැවසූ ගරු සභාපතිතුමා අද දින සභාවේ කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා සහය දැක්වූ සියලු දෙනාටම ස්තූතිය පලකල ගරු සභාපතිතුමා සැමට සුබ දවසක් ප්‍රාර්ථනා කරමින් සභාවේ කටයුතු පස්වරු 12.00ට පමණ නිමාවට පත්කරන ලදී.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,
සභාපති,
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව